**දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල - 2023**

**---------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 1.5.1.1 | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි වගන්ති අංක 21 යටතේ සහ 2020 අගෝස්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි අරමුදල්වල අවසාන ගිණුම් සකස්කිරීම් සම්බන්ධ මාර්ගෝපදේශ යටතේද, අරමුදලක මූල්‍ය ප්‍රකාශන තුල ස්කන්ධය වෙනස්වීම/ශුද්ධ වත්කම් පිළිබඳ ප්‍රකාශනය ඇතුලත් විය යුතු බවට සඳහන් වුවද දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදල සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන යටතේවූ ප්‍රධාන සංරචකයක් වන ශුද්ධ වත්කම් /ස්කන්ධයේ වෙනස්වීම් ප්‍රකාශනය විස්තරාත්මක සටහන් යටතේ අනු කොටසක් වශයෙන් දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශ කට්ටලයක තිබියයුතු ආකෘති රාමුව ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත්කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ඉදිරියේ දී අදාළ ආකෘති රාමුවට ප්‍රකාරව ඉදිරිපත් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලද බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කල යුතුය. |
| 1.5.1.2 | දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මෙන්ම පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම උපයෝගී කර ගනිමින්ද අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මූල්‍ය ප්‍රකාශන තුල සටහන් යටතේ දක්වා ඇති බැවින් අරමුදල නිශ්චිතව මූල්‍ය වාර්තාකරණ රාමුව හෙළිදරව්කර නොමැත. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව උපචිත ගිණුම්කරණ පදනම උපයෝගී කර ගනු ලබමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට අනුබල දෙනු ලබයි.කෙසේ වෙතත් දිරිදිමනා අරමුදලේ ගිණුම පිළියෙල කිරීමේදී ප්‍රමිත අංක 01 හි 131 වගන්තිය අනුව ගිණුම්කරණ පදනම සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව්කර නොතිබුණි. | මුදල් පදනම මත 2023 වර්ෂයේ දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදලේ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලද බව හා ඉදිරි වර්ෂයේ සිට දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදලේ අවසාන මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්කරණ පදනම සඳහන් කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලද බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගිණුම් පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| 1.5.1.3 | 2020 අගෝස්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව මු.රෙ. 877 (2) අරමුදල් ගිණුම් තැබීම, මූල්‍ය ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තා යන උපවගන්තිය යටතේ අරමුදල සඳහා ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව ලැබෙන බලයකින් හෝ මුදල් රෙගුලාසි විධිවිධාන යටතේ ලැබෙන අධිකාරී බලයකින් තොරව අරමුදලේ කිසිදු වියදමක් දැරිය නොයුතු බවට සඳහන්ව ඇතත් 2023 වර්ෂය සඳහා දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල් ගිණුම පිළියෙල කිරීමේදී වාර්තාකරන පදනම තුල අරමුදලේ වියදම් දැරීම සඳහා අධිකාරී බලය ලැබෙන ව්‍යවස්ථාපිත විධිවිධාන හෙළිදරව්කර නොතිබුණි.තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 150 වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ප්‍රසිද්ධ කරන ලද තොරතුරුවල වෙනත් ස්ථානයක හෙළිදරව්කර නැත්නම් අස්තිත්වයක් විසින් හෙළිදරව්කල යුතු බවට සඳහන්<br>අ) අස්තිත්වයේ නිත්‍ය පිහිටි තැන සහ නෛතික ස්වභාවය සහ එය ක්‍රියාත්මක වන කලාපය<br>ඇ) අස්තිත්වයේ මෙහෙයුම් පාලනය කිරීමට අදාලවන ව්‍යවස්ථාව පිළිබඳ යොමුව<br>යන තොරතුරු මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට තොරතුරු දැන ගැනීම සඳහා හෙළිදරව්කල යුතු වුවත් එසේ සිදුකර නොමැති බව නිරීක්ෂණය කෙරේ. | දේශීය ආදායම් අරමුදලේ වියදම් දැරීමට අදාළ අනුමැතිය මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් ගේ අංක MF 1/02/17/IRD/25-Est. හා 2023 ජනවාරි 16 දිනැති ලිපිය මඟින් ලැබී ඇති බව හා දිරිදීමනා අරමුදලේ වියදම් ඇස්තමේන්තුව අනුමත සීමාව තුල සංශෝධනය කිරීම සඳහා අංක MF 1/02/17/IRD/25-Est. හා 2023 ජූනි 14 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබුණ බවත් 2023 වර්ෂයේ දිරිදීමනා ගෙවීමට අදාල කටයුතු දිරි දීමනා කමිටුව නමින් විශේෂ කමිටුව මගින් සිදු කරන ලද බව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව අදාළ තොරතුරු ගිණුම් තුල හෙළිදරව් කල යුතුය. |

1.5.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 99 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව දේශීය ආදායම් දිරි දීමනා අරමුදල පිහිටුවීම සිදුකල යුතු වුවද, මෙතෙක් මෙම අරමුදල ප්‍රායෝගිකව පිහිටුවා නොමැති බැවින් හා 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.41,440,057 ක් වූ නිවාස ණය තැන්පතුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් නමින් පවත්වා ගෙන ගොස් තිබීම මත, උක්ත තැන්පතුවේ දළ පොළී ආදායම මත බැංකුව විසින් අඩුකළ රු.60,314 ක රඳවා ගැනීමේ බදු මුදල ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුවට හිමිකමක් නොමැතිවීම හේතුවෙන් අරමුදලේ පොලි අදායම එම මුදලින් ඌන ගණනය වී තිබුණි. | දේශීය ආදායම් දිරි දීමනා අරමුදලට අදාලව සිදුකල තැන්පතුව සඳහා 2023 වර්ෂයේ රු. 1,363,058 ක දල පොළී ආදායමක් ලැබී ඇති බවත් එම පොළී ආදායම මත 5% ක රඳවා ගැනීමේ බදු අයකර ඇති අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 99 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව දේශීය ආදායම් දිරි දීමනා අරමුදල පිහිටුවීම සිදුකල යුතු වුවද, මෙතෙක් මෙම අරමුදල ප්‍රායෝගිකව පිහිටුවා නොමැති බව. | අරමුදල පිහිටුවා තැන්පතුව අරමුදලේ නමින් පවත්වා ගතයුතු අතර ඉන් ලැබෙන පොළී ආදායම මත බදු බැඳියාවන් සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගිණුම් වර්ෂය අවසන්වී මාස 02ක් ඇතුලත අරමුදල පිළිබඳ සහතික කල මූල්‍ය ප්‍රකාශ සමග කාර්යයසාධන වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර නොතිබුණි. | 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛණය පිළියෙල කර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇති බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,999,390 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 9,060,958 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,061,568 ක පිරිහීමක් නිරීක්ෂණය විය. දිරිදීමනා වියදම රු.54,300,863 කින්ද, වියදම් ඉහලයාම මත තේ සඳහා දීමනාව ඉහල දැමීම හේතුවෙන් පූර්ව වර්ෂයට සාපේක්ෂව තේ සඳහාවූ වියදම සියයට 103.12 කින් හෙවත් රු.18,701,778 කින්ද ඉහළ යාමද මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 3.1.1 | දේශිය ආදායම් සේවයේ නිරත නිලධාරින් සඳහා නිවාස ණය සැපයීමේ අරමුණින් රු.2,500,000 ක මූලික තැන්පතුවකින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ පිහිටුවා තිබූ නිවාස ණය අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.41,440,057ක් වී තිබූ අතර එදිනට රු.14,100,000 ක් ණය ලබාදී තිබූ නිලධාරින් 15 දෙනකුගෙන් රු.4,716,605 ක මුදලක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි. අවසන් වරට නිලධාරියකු වෙත ණය ලබාදීම සිදුව තිබුණේ 2011 දෙසැම්බර් මස 05 දිනවූ අතර එදින සිට පුරා වසර 12කට අධික කාලයක් දෙපාර්තමේන්තු නිලධාරින් වෙත ණය ලබාදී නොතිබුණි. | දේශිය ආදායම් දිරිගැන්වීමේ අරමුදල සඳහා භාණ්ඩාගාරය මඟින් ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා ඇති අතර, දේශිය ආදායම් සේවයේ ස්ථිර නිලධාරීන්ට දේපල ඇපයක් තැබීම මත ණය ලබාදී ඇති බව හා ලබාදෙන ලද උපරිම ණය මුදල රුපියල් 1,000,000 ක් වන බවත් එම ණය මුදල සඳහා වර්ෂ 2011 න් පසුව නිලධාරීන්ගෙන් ණය අයදුම්පත් ලැබී නොමැති බව. | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| 3.1.2 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව රු.1,000,000 ක උපරිම ණය මුදල ලැබීමට හැකියාව ඇත්තේ අයදුම්කරන අවස්ථාව වන විට අයදුම්කරුට හෝ කාලත්‍රයාට හෝ යැපෙන දරුවන් සඳහා ඉඩමක් හෝ නිවසක් සතු නොවන අවස්ථාවකදී පමණි.එසේම මෙම ණය මුදල ලබාගැනීම තුල රජයේ දේපල ණය යෝජනා ක්‍රමය යටතේවූ දේපල ණය අයදුම්කිරීමට යම් නිලධාරියකු වෙත ඇති අවස්ථාව අහිමිවීම මත වඩා ආකර්ශණීය ණය යෝජනාක්‍රමය වෙත නිලධාරින් යොමුවීම හේතුවෙන් පසුගිය වසර කිහිපය පුරාම මෙම ණය යෝජනා ක්‍රමයෙන් නිවාස ණය ලබා ගැනීම සඳහා අයදුම්පත් ලැබී නොතිබුණු අතර 1989 අප්‍රේල් 10 දිනැතිව දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සමග අත්සන් තබන ලද ගිවිසුමේ සඳහන් කොන්දේසි නැවත සමාලෝචනයට ලක්කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි බලධාරින්ගේ අවධානය යොමුවිය යුතුව පැවතුණි. | දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල සඳහා භාණ්ඩාගාරය මගින් ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා ඇති අතර, දේශීය ආදායම් සේවයේ ස්ථිර නිලධාරීන්ට දේපල ඇපයක් තැබීම මත ණය ලබාදී ඇති බව හා ලබාදෙන ලද උපරිම ණය මුදල රුපියල් 1,000,000 ක් වන බවත් එම ණය මුදල සඳහා වර්ෂ 2011 න් පසුව නිලධාරීන්ගෙන් ණය අයදුම්පත් ලැබී නොමැති බව | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| 3.1.3 | දේශීය ආදායම් නිවාස ණය අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම එහි මුළු වත්කම්වලින් සියයට 16 කට ආසන්න වටිනාකමකින් යුක්ත ණය තැන්පතු ගිණුම වසර 10කට අධික කාලයක් නිශ්ක්‍රීය මට්ටමින් රඳවාගෙන පැවත තිබූ අතර බැර ශේෂය සඳහා පොළිය සියයට 3කට ආසන්න මට්ටමෙහි තිබීම අනෙකුත් මූල්‍ය තැන්පතු හා සැසඳීමේදී අවාසිදායක වීමත් ණය අරමුදලේ ශේෂය වර්ධනය කරගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීමත් මත ණය අරමුදලේ කාර්යය සාධනය අවම මට්ටමක පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල සඳහා භාණ්ඩාගාරය මගින් ලබා දී ඇති මුදල් උකස් හා ආයෝජන බැංකුවේ තැන්පත් කර නිවාස ණය අරමුදලක් පිහිටුවා ඇති අතර, දේශීය ආදායම් සේවයේ ස්ථිර නිලධාරීන්ට දේපල ඇපයක් තැබීම මත ණය ලබාදී ඇති බව හා ලබාදෙන ලද උපරිම ණය මුදල රුපියල් 1,000,000 ක් වන බවත් එම ණය මුදල සඳහා වර්ෂ 2011 න් පසුව නිලධාරීන්ගෙන් ණය අයදුම්පත් ලැබී නොමැති බව | ණය අරමුදල පිහිටුවීමේ අරමුණ ඉටුකිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| 3.1.4 | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විගණනයට | ලබාදී ඇති ඉලක්ක ළඟාකර ගැනීම මත ඒ අංශ සඳහා දිරිදීමනා හිමිව ඇති බවත් අංශ 8 ක් හැර ඉතිරි | දිරිදීමනා සඳහා කාර්යය සාධනය ඇගයීමට ක්‍රමවත් |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති පරිදි 2023 ,වර්ෂයට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.බිලියන 2,090 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් ඉපයූ ආදායම වූ රු.බිලියන 1,832 මූලික ආදායම් ඇස්තුමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක අඩුවීමක් විය. කෙසේ වුවද දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා 2023 පළමු අර්ධ වර්ෂය සඳහා දිරිදීමනා ගෙවීමේදී ඇගයීමට ලක්වූ උප ශාඛා 96 ක් අතරින් ශාඛා 08 ක හැර ඉතිරි සියළු ශාඛා සඳහා සියයට 112 ඉක්මවූ කාර්යය සාධනයක් ලබා ගත් බව සලකා සම්පූර්ණ ප්‍රසාද ලකුණු ලබාදී තිබුණි. | සියළුම ශාඛා සඳහා උපරිම දිරිදීමනා පිරිනමා ඇති බව | වැඩපිළිවෙලක් පිහිටවිය යුතුය. |